මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2020
# Primary Piriven First Term Test - 2020

**(03) ත්‍රිපිටක ධර්මය *I***
**ශ්‍රේණිය 04**

කාලය : පැය 03
Time

**සැලකිය යුතුයි.**

- ***I* කොටසේ ප්‍රශ්න සියල්ලම ද *II,III* කොටස් වලින් තෝරාගත් ප්‍රශ්න 04 ක් ද ඇතුළත්ව සියල්ල ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## *I* කොටස

**1) කෙටි පිළිතුරු සපයන්න.**

i. ත්‍රිවිද්‍යා නම් කරන්න.

ii. බාලයෙකුගේ ලක්ෂණ තුනක් (03) පිළිබඳ අංගුත්තර නිකායේ තික නිපාතයේ දැක්වේ. එම ලක්ෂණ තුන නම් කරන්න.

iii. පංච බල ධර්ම නම් කරන්න.

iv. විනයධර භික්ෂුණීන් අතර අග තනතුර දරන ලද්දේ පටාචාරා තෙරණිය වන අතර ඒ සඳහා ඇය ගුණධර්ම පිරීම ආරම්භ කරන ලද්දේ කිනම් බුදුන් දවස ද?

v. චෛතසික ධර්මවල පොදු ලක්ෂණ 4 (හතර) නම් කරන්න.

vi. සතර පරමාර්ථ ධර්ම නම් කරන්න.

vii. ත්‍රි ලක්ෂණය නම් කරන්න.

viii. සබ්බත්ථක කම්මට්ඨාන යනු කුමක් ද?

ix. සතර ඍද්ධිපාද නම් කරන්න.

x. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සමාදන්ව සිටි ධුතාංග ගණන කීය ද?

xi. සතර සතිපට්ඨාන නම් කරන්න.

xii. සංස්කාර ධර්මයන්හි පොදු ලක්ෂණ තුනකි (3) එම ලක්ෂණ තුන (3) නම් කරන්න.

xiii. කෙනෙකු පිළිකුල් සහගත දෙයකින් බියකරු තැනකින් ඈත්වන්නා සේ බුදුරදුන් කෙලෙසුන් කෙරෙන් දුරුවූ සේක. මින් ප්‍රකට වන්නේ බුදුරදුන්ගේ කුමන බුදු ගුණය ද?

xiv. අභිධර්ම පිටකයට අයත් ප්‍රකරණ 07 න් හතරක් (4) නම් කරන්න.

xv. භාවනාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

xvi. සතර සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍ය නම් කරන්න.

xvii. ත්‍රි ශික්ෂා නම් කරන්න.

xviii. චෛතසික සියල්ල කීය ද?

xix. ආසවට්ඨානීය ධර්ම නම් කරන්න.

xx. විනය පිටකය සඳහා ලියවුණු අටුවා ග්‍රන්ථය කුමක් ද?

(ලකුණු : 2 × 20 = 40)

## *II* කොටස

2) (*i*) විනය පිටකයට අයත් ග්‍රන්ථ 05 නම් කරන්න. ලකුණු 04

(*ii*) පාරාජිකා පාලියට අයත් විනය කොටස් නම් කරන්න. ලකුණු 05

(*iii*) ශාසනයේ සුරක්ෂිත භාවයට විනයෙහි ඇති වටිනකම පහදන්න. ලකුණු 06

3) (*i*) චෛතසික ධර්ම මූලික බෙදීම් 3 ක් යටතේ දක්වා ඇත. බෙදීම් 03 නම් කරන්න. ලකුණු 04

(*ii*) අන්‍යසමාන චෛතසික 13 නම් කරන්න. ලකුණු 05

(*iii*) ඉන් 03 කට කෙටි සටහන් ලියන්න. ලකුණු 06

4) (*i*) සැම තැනකදීම කිසිදු භේදයකින් තොරව සැම අයෙකුටම වැඩිය හැකි කලිෂ්ඨාන මොනවා ද? ලකුණු 04

(*ii*) දසකසින නම් කරන්න. ලකුණු 05

(*iii*) කසිනයක් අරමුණු කොට භාවනා වඩන අයුරු පහදන්න. ලකුණු 06

5) (*i*) සාරාණීය ධර්ම 06 න් (හයෙන්) හතරක් (4) නම් කරන්න. ලකුණු 04

(*ii*) පිරිසිදු ශීලයක පැවතිය යුතු අංග අටෙන් (08) පහක් (05) නම් කරන්න. ලකුණු 05

(*iii*) සමගි සම්පන්න භික්ෂු සමාජයක් උදෙසා සාරානීය ධර්ම පිළිපැදීමේ ඇති වටිනාකම පහදන්න. ලකුණු 06

## *III* කොටස

6) (*i*) නව අරහාදී බුදු ගුණ පිළිවෙළින් ලියන්න. ලකුණු 04

(*ii*) අරහං බුදු ගුණය පැහැදිලි කරන්න. ලකුණු 05

(*iii*) දුල්ලභදස්සනා යන්න පහදන්න. ලකුණු 06

7) පහත දැක්වෙන ගාථා අතුරින් 2 ක් සම්පූර්ණ කරන්න.

(*i*) දීඝාජාරතො රතති.......

(*ii*) චරත්වේ නාදි ගච්ඡෙය්‍ය..................

(*iii*) පුතතා මත්ථි ධනං මත්ථි............

(*iv*) යො බාලො මඤ්ඤති බාලං..... ලකුණු 04

(*v*) ඔබ සම්පූර්ණ කල ගාථා දෙකෙහි අර්ථය ලියන්න.

8) (*i*) පංචස්කන්ධය නම් කරන්න. ලකුණු 04

(*ii*) සංස්කාර ධර්ම යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න. ලකුණු 05

(*iii*) මෙය මාගේය යන ආකල්පය දුරු කර ගැනීම සඳහා ත්‍රිලක්ෂණයෙහි ඇති උපයෝගීතාව පෙන්වා දෙන්න. ලකුණු 06

9) (*i*) බුද්ධ කාලීන ෂට් ශාස්තෘවරු නම් කරන්න. ලකුණු 04

(*ii*) ඔවුන්ගේ දර්ශනවාද මොනවා ද? ලකුණු 05

(*iii*) ඉන් ඔබ කැමති ශාස්තෘවරයෙකු පිළිබඳ කෙටි සටහනක් ලියන්න. ලකුණු 06